# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/58 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

115 වන වගන්තිය යටතේ නියෝග

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 115 වන වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මම 2018.04.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි දැක්වෙන උපලේඛනයේ දක්වා ඇති අවස්ථා සඳහා බදු ගෙවන්නෙකු වෙනුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග කටයුතු කිරීම සඳහා බදු ගෙවන්නෙකුට බලයලත් නියෝජිතයකු පත්කරනු ලැබිය හැකි අවස්ථා මෙම නිවේදනය මගින් නිශ්චිත කොට දක්වමි.

ඩී. එම්. එල්. අයි. දිසානායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

1. 102 වගන්තිය ප්‍රකාරව බදු ගෙවන්නන් ලියාපදිංචිය හා බදු වර්ග ලියාපදිංචිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමග කරන සියලුම වර්ගයේ ලිපි ගනුදෙනු කිරීම සඳහා.

2. පනතේ 103 (5) වන වගන්තිය ප්‍රකාරව බදු ගෙවන්නන්ගේ වාර්තා විස්තරයන්හි යම් වෙනස්වීමක් සිදුවුවහොත් දැන්වීම සඳහා.

3. බදු ගෙවන්නා හා ඒ සම්බන්ධව සියලුම වර්ගයේ ලිපිගොනු පවත්වාගන යාම වෙනුවෙන් 107 වන වගන්තිය අනුව පෞද්ගලික රීති නියමයන් අයදුම් කිරීම සඳහා.

4. 118 වන වගන්තිය අනුව කොමසාරිස් ජනරාල් විසින් සැපයීමට ඇති යම් තොරතුරක් ඉල්ලුම් කිරීමට හා ලැබීම සඳහා.

5. සහකාර කොමසාරිස්වරයකුට අවශ්‍යවන යම් තොරතුරක් සැපයීමට හෝ පනතේ 123 වන වගන්තිය ප්‍රකාරව වෙනත් යම් අවශ්‍ය පරමාර්ථයක් සඳහා දැන්වීමකින් නියමකරගත් වේලාවකදී හා ස්ථානයකදී පෙනී සිටීමට.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

6. පනතේ XI පරිච්ඡේදයෙන් ඉල්ලුම්කර ඇති බදු වාර්තා, අතිරේක වාර්තා හා තොරතුරු වාර්තා ගොනු කිරීම සඳහා.

7. පනතේ 136 වන වගන්තිය ප්‍රකාරව ස්වයං - තක්සේරුවක වාර්තාවට සංශෝධනයක් කිරීම සඳහා අයදුම් කිරීමට.

8. පරිපාලන සමාලෝචන සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන සමාලෝචනවලදී බදු ගෙවන්නා නියෝජනය කිරීම, අවශ්‍ය අවස්ථාවලදී ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරීමට හා බදු ගෙවන්නන් වෙනුවෙන් කොමසාරිස් ජනරාල්වරයා සමග එකඟතාවයකට පැමිණීම සඳහා.

9. පනතේ 130 වන වගන්තිය අනුව වාර්තා ගොනුකිරීම සඳහා කාලය දීර්ඝ කිරීමට ඉල්ලුම් කිරීම හා පනතේ 151 වන වගන්තිය අනුව ගෙවීමේ කාලය දීර්ඝ කිරීම සඳහා.

10. ආපසු ගෙවිය හැකි ප්‍රමාණයක් ඉල්ලුම් කිරීමට හා පනතේ 150 වන වගන්තිය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සමග සියලුම වර්ගවල ලිපි ගනුදෙනු කිරීම සඳහා.

11. මෙම පනත යටතේ යම් වරදකට නඩු පැවරිය හැකි 186 වන වගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන බදු ගෙවන්නා නියෝජනය කරනු ලබන ඕනෑම වර්ගයක විමර්ශනයක් සඳහා.

12. බදු ගෙවන්නා වෙනුවෙන් පනතේ 93(3) වගන්තිය ප්‍රකාරව ප්‍රාග්ධන ලාභ බදු වාර්තා ගොනු කිරීමට.

13. බදු ගෙවන්නා නියෝජනය කරනු ලබන, බදු ගෙවන්නා විසින් ලිඛිතව විශේෂයෙන් නියෝජිතයාට බලයදීම වන වෙනත් යම් කාර්යයක් සඳහා.

05 - 51

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.